සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකය: |
|---|

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. ඔහු <u>ගිනි කන්නෙක්</u> බව කවුරුත් දැන සිටියහ.
(1) කම්මලේ වැඩකරන අයෙක් (2) අයුතු අසාධාරණ ලෙස මුදල් ගන්නෙක්
(3) දිවා කාලයේ වැඩකරන අයෙක් (4) අමාරු කාරයෙක්

02. ස්වාමියා සේවකයාට <u>තෝං ලණුව දමා</u> ඇති බව ඔහුගේ ක්‍රියාදාමයෙන් පෙණිනි.
(1) අත්දෙක බැඳ තබා (2) සිරකර දමා
(3) සිතු පරිදි කටයුතු කරවා ගත්තා (4) අපහාස කර

03. <u>තොර තෝංචියක් නැතිව</u> කතා කරමින් සිටි සභාපති පපුව අල්ලා ගෙන පුටුවේ වාඩි විය.
(1) ඉවරයක් නැතිව (2) අතපය විසිකරමින් (3) කණුවට හේත්තු වී (4) අනවශ්‍යය ලෙස

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. රටක ................................ වැඩ කිරීමට සියලු දෙනා පෙළ ගැසිය යුතු ය.
(1) කැමැත්තට (2) ආගමනයට (3) අලංකාරයට (4) උන්නතියට

05. ඒ විසල් භූමිභාගය පිරීයන ලෙස ගොඩනැගිලි කිසි දාක හෝ ඉදි වේ දැයි .................................... සැකයක් මා තුළ විය.
(1) අසාධරණ (2) උභතෝකෝටික (3) සාධාරණ (4) පැහැදිලි

06. නිර්මාණ කාර්යය යනු කලාකරුවා සිය අත්දැකීම් ඇසුරෙන් තමා ලද ................................ අන්‍යයන් වෙත ඉදිරිපත් කිරීමකි.
(1) සතුට (2) ජීවිතය (3) දැනුම (4) වින්දනය

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ධර්මිෂ්ඨ, අනර්ඝ, කුමන්ත්‍රණය, කෘෂිකර්මය (2) දුම්රියපොළ, ශතවර්සය, දර්ශන, ආශ්වාස
(3) ස්වාභාවික, ප්‍රස්තාර, විශ්මිත, ශාස්ත්‍රීය (4) නිශ්චල, කනිෂ්ඨ, ෂඩ්වර්ණ, දුස්කර

08. ''ශරීරය, වතුර, දැකැත්ත, තරාදිය''යන වචනවල දෙවන අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) දිගු ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල, ඇලපිල්ල
(2) කෙටි ඇදපිල්ල, ඇලපිල්ල, දිගු ඉස්පිල්ල, කෙටි පාපිල්ල
(3) දිගු ඉස්පිල්ල, කෙටි ඇදපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල
(4) කෙටි පාපිල්ල, ඇලපිල්ල, දිගු ඉස්පිල්ල, කෙටි ඇදපිල්ල



EXAMRESULTS.LK

09. ''චන්දන'' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වනුයේ,

(1) දන්තජ හා ඕෂ්ඨජ ය. (2) තාලුජ හා දන්තජ ය.

(3) තාලුජ හා ඕෂ්ඨජ ය. (4) මූර්ධජ හා තාලුජ ය.

10. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1) කටුගස්තොට, කුරුණෑගල, පාදෙනිය, වාරියපොළ

(2) හලාවත, ආනමඩුව, පුත්තලම, වැල්ලව

(3) අනුරාධපුරය, කැකිරාව, පුලියන්කුලම, තලාව

(4) වව්නියාව, කන්නකසන්තුරේ, ත්‍රිකුණාමලය, යාපනය

11. අනුක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) නයෙකු, මුවෙක්, සේවකයෙකු, ගොවියෙකු (2) පක්ෂීන්, පැටියෙකු, උගතෙක්, ශිෂ්‍යයන්

(3) කුමාරිකාවක, කුරුල්ලන්, මිනිසෙකු, හාවෙකු (4) මම, අප, ඔවුන්, තොප

12. කුරුල්ලා කූඩුවෙන් බිමට වැටුණි. මෙහි ''කූඩුවෙන්'' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) ප්‍රථමා (2) කරණ (3) සම්ප්‍රදාන (4) අවධි

13. දසබල යන්න අයත් වන්නේ,

(1) විශේෂණ සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය.

(3) විභක්ති සමාසයට ය. (4) 'ද' කාරාර්ථ සමාසයට ය.

14. ''මිහිරි + ආ'' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍ය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) මිහිරි බව (2) මිහිරිතම (3) මිහිරිතා (4) මිහිරියා

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) උපසර්ග - සුදන, ඉමිහිරි, විදේශ, උපනායක

(2) සන්ධි - මාර්ගෝපදේශ, තෙල්මල්, ඈත, ගුරුතුමා

(3) පූර්ව ක්‍රියා - ගොස්, සෝදා, වැඳ, බලා

(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා - නටවයි, කප්පවයි, පද්දවයි, දුවවයි

16. සමාස පදයක් යෙදී නැති වාක්‍ය කුමන් ද?

(1) දරු දැරියෝ තම දෙමව්පියන් බැලීමට ගිය හ.

(2) උදෑසන ආහාරය සඳහා අම්මා කිරිබත් සාදා තිබුණි.

(3) අපි උදෑසන ම පාසලට ගොස් මිදුල් අතු ගෑවෙමු.

(4) ඈ දිගු වරලසක් ඇති කාන්තාවකි.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

17. ඇය **අර්චනීය** කාන්තාවක බව කාගේත් පිළිගැනීම විය.

(1) පිදිය යුතු (2) උගත් (3) සිත් ඇදගන්නා සුලු (4) ආචාරශීලී නොවන

18. **වැරටිල්ලා** සහිත පසෙහි ඉන්ද වූ පැළ ඉතා හොඳින් වැඩී තිබුණි.

(1) ගැඩවිල්ලන් (2) වියළි ගොම කැබලි (3) වැලි (4) මඩරොල්ල

19. පෙරදිග විචාරකයෝ කවියකු බිහි වීමට බලපාන එක් හේතුවක් ලෙස **ව්‍යුත්පත්තිය** දක්වති.

(1) වක්‍රෝක්තිය (2) නිරන්තර අභ්‍යාසය (3) පරිණත අවබෝධය (4) අපූර්වත්වය

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නො පවත්නා පේළිය තෝරන්න.

(1) ප්‍රේක්ෂකයා, රචකයා, අධ්‍යක්ෂ, නිෂ්පාදක (2) ශිෂ්‍යයා, ශිෂ්‍ය නායක, ගුරුවරයා, විදුහල්පති

(3) බලයා, කෙලවල්ලා, ලූලා, සාලයා (4) කරාඹුව, මාලය. වළල්ල, මුද්ද

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) වටිනා - මහඟු, අනංග - වියොවග, පුදුම - අරුම, පරසිඳු - ප්‍රකට

(2) අස්න - හසුන, පෘථුල - පුළුල්, අසල - නුදුරු, සසල - ස්ථාවර

(3) වෘද්ධ - මහලු, නෙක - නොයෙක්, පිළිමල් - සතුරු, මිහි - ගගන

(4) රැහැන - ලණුව, මුසු - මිශ්‍ර, කප - කල්පය, අල්ප - අනල්ප

22. මුලින් දී ඇති පදයට සමානාර්ථ නො දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මඟ - මං, මාවත, පථය, වීදිය

(2) ශක්‍ර - විදුරුව්, තිදසිඳු, සක්, සුරපති

(3) සුදු - හෙළ, ධවල, ශ්වේත, ලෝහිත

(4) නීච - පහත්, හීන, නිවට, දීන

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නො වන වරණය තෝරන්න.

(1) මුදිත - අමුදිත (2) සුලබ - දුලබ (3) නියුක්ත - යුක්ත (4) අල්ප - අනල්ප

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) ''ගයන්නාට'' යන්න කරණ විභක්ති නාම පදයකි

(2) ''නො'' යනු නිපාත පදයකි

(3) ''ග'' යන්න මහාප්‍රාණ අක්ෂරයක් නොවේ

(4) ''ගත්තෙහු'' යන්න මධ්‍යම පුරුෂ අතීත කාල ක්‍රියා පදයකි

25. පහත දැක්වෙන වාක්‍ය අතරින් මනා පද ගැළපීමක් ඇති අර්ථාන්විත වාක්‍ය තෝරන්න.

(1) ජීවිතයේ එදිනෙදා මෙන් ම අදහස් දැක්වීම කථනය මගින් කිරීම විශේෂ අවස්ථාවල දී ද වැදගත් ය.

(2) රටක බුද්ධිමත් පිරිස නිරෝගී විය යුතු අතර සැබෑ රටක දියුණුවක් ඇතිවීමට එය හේතුවකි.

(3) පුවත්පතක වැදගත් ම කාර්යභාරය වන්නේ ජනතාවට නිවැරදි තොරතුරු කලට වේලාවට සැපයීමයි.

(4) බුදු දහම මගින් කරන ලද මෙරට සංස්කෘතික උදෙසා හා සාරධර්ම හැඩගැන්වීමේ කාර්යභාරය සුවිශාල ය.

- **අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

26. ප්‍රයෝජනයක් ගත නො හැකි දෙයක් කෙනෙකුට දීම,

(1) අහසට ඉනිමං බැන්දා වගේ

(2) කැලේට පායපු හඳ වගේ

(3) නරියට කුකුල් කොටුව බාර දුන්නා වගේ

(4) ආතාට අටුකොස් දුන්නා වගේ

27. වැරැද්දේ වගකීම දුබලයාට පැවරීම,

(1) හිගන්නාගේ පාත්තරේට හෙනහුරු වැටුණා වගේ

(2) නියර මිටිතැනින් වතුර බහිනවා වාගේ

(3) එපා වාහෙට හොඳි බෙදනවා වගේ

(4) පල නොකියා පලා බෙදනවා වගේ

28. ස්වරාදේශ සන්ධියට හා ස්වර සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) පන්සාලිස්, ඔවුනොවුන්

(2) විවිධාර්ථ - සන්නිවේදන

(3) පරමේශ්වර, පිනැති

(4) පැහැති - මලසුන

- **අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29. (1) දරුවෝ රටේ අනාගත භාරකරුවන් ය.

(2) ඔවුහු යෝජනාවට පක්ෂ ව කැමැත්ත දී ඇත.

(3) ක්‍රීඩකයෝ තුන්දෙනෙක් ජගත් සම්මානයට පාත්‍ර වූ හ.

(4) සංවිධායකවරු විසින් අලංකාර ලෙස පෙරහැර සංවිධානය කරන ලදහ.

30. (1) ඔවුහු නිවැරදිකරුවන් මෙන් පෙනී සිටිති.

(2) ඕ තොමෝ නිහඬ ව ප්‍රතිචාර දක්වති

(3) කලාකරුවෝ නිසි වේලාවට පැමිණෙති' යි සංවිධායකවරු සිතූහ.

(4) නිවේදකයා හෝ නිවේදිකාව අදහස් ප්‍රකාශ කළේ ය.

31. • එතුමා මාධ්‍යකරුවෙකු ....................................... වාර්තාව යැව්වේ ය.
• දින කීපයක් ගත වන ................................. මේ අවපාතය පවතිනු ඇත.
• දරුවන් ..................................... යන ගමන අපට ප්‍රීතිය ගෙන දුන්නේ ය.
• වර්තමානයේ තාක්‍ෂණය ........................................ දරුවන් පොතපතින් ඈත් වී ඇත.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) නිසා, කැටුව, වෙත, තුරු (2) කැටුව, වෙත, තුරු, නිසා
(3) වෙත, තුරු, කැටුව, නිසා (4) නිසා, තුරු, කැටුව, වෙත

32. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''ඒ ඇත්තෝ අපි අතරින් පිට වුණා''

(1) ඔවුහු අප අතරින් බැහැර වූහ. (2) ඔවුන් අප අතරින් බැහැර විය.
(3) ඔවුන් අපි අතරින් බැහැර වූහ. (4) ඔවුන් අපි අතරින් බැහැර වීමු.

33. පහත සඳහන් පද්‍යයෙහි හතරවන පදය දැක්වෙන වරණය තෝරන්න.

එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ
මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ
දෙගොඩ හරිට ගෙවිලා පිනි වැටෙන්නේ
.....................................................................................

(1) පාන්දරට යාන්තම් ඇස පියෙන්නේ (2) හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ
(3) දෙගොඩ ගොඩින් කොතනද නුඹ සිටින්නේ (4) හිතේ දුකට එතකොට කවි කියවෙන්නේ

34. රූපකයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සිඳු තුළ නොසිට නැඟී මෙන් වළඹ ගිනි වැට (2) අම රසවන් අඹ රස බුදිමින් සිනිදු
(3) සන්නන් සිහින් ගෙදි සෙවණලු වැලි තෙලෙන (4) උදුල සොමි කැලුම් නිසයුරු හිමි පුවළ

35. පහත ගී කාණ්ඩයේ රචකයා වන්නේ,

කළු ගැහී තරඟයට ඉහළ ගිය
සිමෙන්ති බිත්ති මිසක
ඇසට නිලට
අහසක් ගහක් කොළක්
අවටක් නැත

(1) ඩබ්. ඒ. අබේසිංහ මහතා ය. (2) මහගමසේකර මහතා ය.
(3) ගුණදාස අමරසේකර මහතා ය. (4) කුමාරතුංග මුනිදාස මහතා ය.

36. පහත දැක්වෙන සංවාදය අයත්වන නාට්‍ය කුමක් ද?
''මම මේ කියන්නේ ළෙන්ගතුකමට. මේ බිත්ති හතරෙන් එහා තියනවා තවත් ලෝකයක්''

(1) සිංහබාහු (2) තලමල පිපිලා (3) හුණුවටයේ කතාව (4) දූන්න දූනුගමුවේ

37. අලගියවන්න මුකවෙටිතුමාගේ කෘතියක් නො වන්නේ,

(1) සැවුල් සන්දේශය (2) කුස ජාතක කාව්‍ය (3) සුභාෂිතය (4) ගිරා සංදේශය

38. සිරිමාන්න මහතා, අබිලිං උන්නැහේ යන චරිත ඇතුළත් කෙටිකතාව වන්නේ,

(1) වතුර මල (2) මං තනන්නෝ (3) තොරොක්කෝව (4) උපාසකම්මා

39. සත්කෝරල වැසියන් ''වයිතාලය'' යනුවෙන් හඳුන්වන්නේ,

(1) සවස් කාලය (2) උදෑසන (3) දිවා කාලය (4) රාත්‍රිය

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
ශාස්ත්‍රීය ලේඛනයක දී නිශ්චිතාර්ථවත් ව ද නිර්මාණාත්මක ලේඛනයක දී භාවාර්ථවත් ව ද වචන සංකලනය කළ යුතු ය.

(1) නිශ්චිතාර්ථවත් ව මෙන් ම භාවාර්ථවත් ව ද වචන සංකලනය ශාස්ත්‍රීය ලේඛනවල වැදගත් ය.
(2) වඩාත් නිර්මාණාත්මක වචන සංකලනය අවශ්‍ය වන්නේ නිර්මාණාත්මක ලේඛනවල ය.
(3) නිර්මාණාත්මක ලේඛනයක නිශ්චිතාර්ථවත් වචන සංකලනය වැදගත් ය.
(4) නිශ්චිතාර්ථවත්ව ශාස්ත්‍රීය ලේඛනයේ දී ද භාවාර්ථවත් ව නිර්මාණාත්මක ලේඛනයක දී ද වචන යොදා ගත යුතු ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2022

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- **අංක (i) සිට (x) දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) (i) (අ) ''ගෞරවය'' යන පදය ලිවීමේ දී ''ගෞ'' අකුර සමඟ බැඳී ස්වරය කුමක් ද?

(ආ) ''<u>කෛ</u>ලාසන'' යන පදයේ ඉරි ඇඳි අක්ෂරය නිර්මාණය වූ ආකාරය ලියන්න.

(ii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

(අ) ප්‍රස්තාවෝචිත

(ආ) දුරවබෝධය

(iii) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාසය දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

''ගල් යුගයේ දඩයම් දිවියෙන් ගෘහස්ත ගොවි ජීවිතයට සංක්‍රමනය වීමත් සමඟ මැටි කර්මාන්තයට අවශ්‍ය පදනම නිර්මාණය විණි.''

(iv) පහත සඳහන් වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් නිවැරදි ව ලියන්න.

(අ) කලු

(ආ) කළු

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

(අ) කොතෙක් ඉසුරු ලැබුණත් නැණවතා ආයෝග්‍ය දේ නොකරති.

(ආ) අපි සියල්ලෝ ම ශ්‍රී ලංකාවේ වැසියන් වෙමු.

(vi) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය ලියන්න.

(අ) දරුවෝ නිසි මඟ අවබෝධකර <u>ගනිත්වා</u>!

(ආ) වැසි <u>වසිද්දී</u> උද්ඝෝෂකයෝ ඉදිරියට ම ගියහ.

(vii) පහත සඳහන් යෙදුම්වල පළමු හා දෙවන පද අතර නො ගැළපීමක් ඇත. පළමු පදයට ගැළපෙන සේ <u>දෙවන පදය</u> සකස් කර ලියන්න.

(අ) සොඳුරු දර්ශනය

(ආ) සූර්ය මඬල

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය ලියන්න.

(අ) සැලසුම් සහගත ව කටයුතු කිරීම.

(ආ) ඉතා දීර්ඝ කාලයක් තිස්සේ පවතින.

(ix) පහත දැක්වෙන යෙදුම් සඳහා (හේන්) ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචනය ලියන්න.

(අ) කලවිට

(ආ) සේරංගාව

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) වෛද්‍යවරු අසරණ රෝගීන් සුවපත් කරති.

(ආ) ගොවියෝ මේ කන්නයේ සරු අස්වැන්නක් ගනිති.

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තරය අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනා ලිවීම ආරම්භ කරන්න. මාතෘකාවක් ද යොදන්න.

(අ) කාබනික පොහොර පමණක් ය යන ප්‍රතිපත්තිය නිසා වී ඇතුළු කෘෂිකාර්මික බෝග බොහෝමයක නිෂ්පාදන අඩාල විය. එමෙන් ම පවතින උද්ධමනකාරී තත්ත්වය තුළ කෘෂිකාර්මික යෙදවුම්වල ද කෘෂි නිෂ්පාදනවල ද මිල ඉහළ යාම සිදුවී ඇත. මේ නිසා උග්‍ර ආහාර හිගයකට ශ්‍රී ලංකාව මුහුණු දෙමින් සිටියි. එමෙන් ම ජනතාවගේ ක්‍රය ශක්තිය (මිල දී ගැනීමේ හැකියාව) දුර්වල වෙමින් පවතී. වස විසෙන් තොර ආහාර මෙන් ම ජනතාවගේ කුස පුරවා ගැනීමට මෙන් ම සෞඛ්‍ය හා නිරෝගීමත්භාවය රැකෙන අයුරින් ආහාර පරිභෝජනයන් ගොඩ නැංවීමේ කෙටි කාලීන අවශ්‍යතාවයන් දැඩි ව මතු ව පවතී. එබැවින් කඩිනම් ආහාර සුරක්ෂිතතා වැඩසටහනකට යාම ප්‍රතිපත්තිමය කාරණාවක් ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර ඇත.

(ආ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ විවේචන එල්ල වන්නේ එය කොතරම් දුරට ප්‍රායෝගික ද යන්න පිළිබඳ ව කෙරෙන විවිධ සාකච්ඡාවන් සමග ය. කොරෝනා ගෝලීය වසංගතය තත්ත්ව කාලය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අදාළ ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අවශ්‍යතාවය තිබෙන බව විද්වත් මතය විය. නව තාක්ෂණය යොදාගෙන නව ලොවට මුහුණු දීම සඳහා රටේ අනාගත පරපුර ගොඩ ගැනීමට අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව ඉතා වැදගත් වී ඇත. බොහෝ රටවල් විද්‍යුත් අධ්‍යාපන සංකල්පයෙන් ඉදිරියට ගොස් ඇත. අපේ රටේ පවතින්නේ පෙළපොත් විශාල ප්‍රමාණයක් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයකුයි. එක් අතකින් එය රජයට වැය බරකි.

(ඉ) වර්තමානය වන විට ශ්‍රී ලංකාව උග්‍ර ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටියි. ශ්‍රී ලංකා ආර්ථිකයට එකතුවන වර්තමාන ශ්‍රමබලකාය උරා ගැනීමේ ශක්තියක් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ පෙනෙන මානයක දක්නට නොමැත. තරුණ අසහනය දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. විදේශ රැකියා සොයා දහස් ගණන් තරුණයෝ මෙරටින් පිටවෙමින් සිටිති. මෙම කාරණයේ දී ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලැබෙතත් රටේ ජවසම්පන්න ම පිරිස විදේශ ගත වීම ශ්‍රී ලංකා ආර්ථිකයට බලවත් පහරකි. එමෙන් ම රට ඵලදායී ලෙස යොදාගත හැකි බුද්ධිමත් ප්‍රජාවක් අහිමි වීම දැරිය නො හැකි පාඩුවකි. වර්තමානයේ උගත් බුද්ධිමත් පිරිස රට හැරයාම හමුවේ මෙරට ඇතිවිය හැකි සමාජ ආර්ථික දේශපාලන බලපෑම කඩිනමින් අවධානයට යොමු විය යුතු ප්‍රශ්නයකි.

(ඊ) ඖෂධ මිල ගණන් ඉහළ යාම හා හිගය හමුවේ රෝගීහු මිය යමින් සිටිති. ශ්‍රී ලංකාව ලොව බොහෝ රටවල් මෙන් නොව ප්‍රතිපත්තිමය වශයෙන් නිදහස් සෞඛ්‍යය සේවාවක් ස්ථාපිත කර තිබුණත් ජනතාවට රජයේ රෝහල්වලින් පවා ඖෂධ හා විවිධ පරීක්ෂණ, මුදල් ගෙවා බාහිරින් ගෙන්වා රෝගීන්ට ලබා දීමට නියම කරයි. මෙය ආර්ථික අර්බුදයට පමණක් නොව දීර්ඝ කාලයක් තිස්සේ රජය විසින් වරින් වර අනුගමනය කරන ලද සෞඛ්‍ය ප්‍රතිපත්තිවල හා ඇතැම් ඖෂධ සමාගම්වල ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයකි. එකම ඖෂධ විවිධ වෙළෙඳනාමයන් ඔස්සේ ඖෂධ සමාගම් දැඩිව ප්‍රචාරණයේ නියැලී සිටියි. එබැවින් නිදහස් සෞඛ්‍යයක් මෙන් ම ඖෂධ ප්‍රතිපත්තිය ඉතා දැඩිව ක්‍රියාත්මක කර රටට අවශ්‍ය සෞඛ්‍ය සම්පන්න නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම යුගයේ අවශ්‍යතාවයකි.

03 පහත දැක්වෙන ඡේදයේ වචන ගණන 50 - 60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

අපේ පුරෝගාමී ඉතිහාසඥයෙකු හා පුරා විද්‍යාඥයෙකු වන මහාචාර්යය පරණවිතාන මහතා කියන්නේ ඉතිහාසය පවා හැඩගැස්වීමට වෘක්ෂලතාදිය හේතුකාරක වන බවයි. මනුෂ්‍ය වාසයක් පවා ඇතිව තිබෙන්නේ අනිවාර්යයෙන් ම වෘක්ෂලතාදිය නො අඩුව වැවෙන ප්‍රදේශ පාදක කොටගෙන බව එතුමා අපට ඒත්තු ගන්වයි. රටක වෘක්ෂලතාදිය ඇතිවන්නේ එහි දේශගුණය, පස ආදී භූගෝලීය සාධකයන් මුල්කරගෙන ය. තව ද ඒ වෘක්ෂලතාදිය අනුව ඒ රටේ ඉතිහාසයන් එක්තරා ප්‍රමාණයකට හැඩ ගැසෙන බව ද කිව යුතු ය. මනුෂ්‍යවාසයක් ඇති වී තිබෙන්නේ මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන වෘක්ෂලතාදිය පහසුවෙන් වගා කළ හැකි ප්‍රදේශවල ය. පරිසරය ද වෘක්ෂලතාදිය නිසියාකාර ව ආරක්ෂා වීම ජන ජීවිතයෙහි පැවැත්මට මහත් ම ආධාරකයක් වන බව ඉන් ගම්‍යමාන වේ. එහෙත් වෘක්ෂලතා පිළිබඳ පුරාණයේ තිබූ සැලකිල්ල අද වනවිට බොහෝ සේ මිය ගොස් ය. වෘක්ෂලතා විනාශය අද දින ජාතික ප්‍රශ්නයක් බවට පත් ව ඇත.

අවිචාරාත්මක ලෙස වෘක්ෂලතා විනාශ කිරීම හේතුකොට ගෙන ලක්දිව ඇතැම් පෙදෙස් කාන්තාර වීමේ ලකුණු පහළ කරන බව සඳහන් වේ. කෙළවරක් නොමැති ව කෙරෙන්නා වූ වෘක්ෂලතා විනාශය තුළින් ජනිත කරන්නා වූ අයහපත් ප්‍රතිඵල අනාගතයේ දී අපට භුක්ති විඳීමට සිදුවනු ඇතැයි දේශීය මෙන් ම විදේශීය බුද්ධිමතුන් පෙන්වා දී ඇත. මෙහි දී සිහිපත් කළ යුතු විදේශීය පඬිවරයෙකු නම් ආර්. එල්. බ්‍රෝහියර් මහතා ය. ලංකාවේ අනතුරට පත් වනාන්තර පිළිබඳ ව ඔහු කතා කොට ඇත්තේ වේදනාබර හදවතකිනි. අධ්‍යාපනික වශයෙන් ඉතා ප්‍රබෝධජනක වූ ද, ඇසට ඉතා සංතෘප්තකර දර්ශනයක් වූ ද, වනාන්තර ඉතා ආසන්න ආනාගතයේ දී ම පුරාවෘත්තයක් බවට පත් වේයැයි බ්‍රෝහියර් මහතා අනතුරු අඟවයි.

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

ඉතිහාසඥයන් උඩරට රාජධානිය කෙරෙහි දක් වූ අවධානය ප්‍රමාණවත් නො වන බව ප්‍රකාශ කිරීම නිර්දය විවේචනයක් නො වනු ඇත. දහසය වන ශත වර්ෂයෙන් පසු ශ්‍රී ලංකා ඓතිහාසික අධ්‍යයන මෑතක් වන තුරු ම පවත්වා ඇත්තේ යටත් විජිත රාමුව ඇතුළත, දිවයිනෙහි බටහිර මුහුදුබඩ තීරුවෙහි පාලන බලය දුරුවත් මුහුණු පෑ ගැටලු පිළිබඳව ය. ඒ සෑම අධ්‍යයනයක ම මහනුවර පිළිබඳ වටිනා සිත් ගන්නා යමක් ඇතුළත් වන බව සැබෑ ය. එහෙත් මෙහි දී සැලකිල්ලට ගත යුතුව ඇත්තේ මහනුවර යනු ඔවුන්ගේ අවධානයෙහි සීමාවෙහි පිහිටියක් බව ය. ඒවායේ මූලික අවධානය යොමුව ඇත්තේ කෝට්ටේ රාජධානිය කෙරේ හෝ කෝට්ටේ රාජ වංශය අවසානයෙන් පසු එම බිම් පෙදෙස් පාලනය කළ පෘතුගීසි හා ඕලන්ද ජාතිකයන් කෙරෙහි ය. කෙටියෙන් කිවහොත් වැඩි වශයෙන් ලිය වී ඇත්තේ යටත් විජිත ඉතිහාසය යි.

සිංහල රාජධානිය ස්වකීය ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට වෙර දැරූ ආකාරය කෙරෙහි ඔවුන්ගේ සැලකිල්ල යොමු වූයේ මඳ වශයෙනි එසේ වුව ද පසුගිය දශක දෙක ඇතුළත එස්. ආර්සරත්නම්, කේ. ඩබ්ලිව් ගුණවර්ධන සහ ටිකිරි අබේසිංහ යන විද්වතුන්ගේ ලිපි ලේඛනවල නව ප්‍රවණතාවක් දක්නට ලැබේ. යටත් විජිත ඉතිහාසය ලියන අතරට ඔවුහු දේශීය ආයතන කෙරෙහි ද දැඩි උනන්දුවක් දක් වූහ.

උඩරට රාජධානිය පිළිබඳ ව වූ ඓතිහාසික ලිපි ලේඛන හිඟ වීමට හේතු දැක්විය හැකිය. ලෞකික ඉතිහාසය ලේඛනගත කිරීමට දියුණු දේශීය සම්ප්‍රදායන් ශ්‍රී ලංකාවේ නො තිබීම එක් හේතුවක් වෙයි. උඩරට රාජධානියේ ලේඛනාගාරයට අයත් එක ද කඩදාසියක් හෝ තල්පත් ඉරුවක් හෝ සුරැකිව ශේෂ ව නොමැති ය. වැදගත් ලිපි ලේඛන රාශියක් ම බොහෝ විට පන්සල් සතු පුස්තකාලවල හෝ පුද්ගලයන් සතුව හෝ විසිර පවතී.

(i) උඩරට රාජධානිය පිළිබඳ වූ ඓතිහාසික ලිපි ලේඛන හිඟ වීමට හේතු 02 ක් ලියන්න.

(ii) කේ. ඩබ්ලිව් ගුණවර්ධන වැනි විද්වතුන්ගේ අධ්‍යයනය, ඉතිහාසඥයින්ට වැදගත් වන්නේ කවර හෙයින් ද?

(iii) ශ්‍රී ලංකාව යටතේ විජිත යුගයේ ඓතිහාසික අධ්‍යයනයේ දී වැඩිපුරම අවධානය යොමු කර ඇත්තේ කුමන රාජධානිය පිළිබඳව ද?

(iv) කෝට්ටේ රාජවංශය අවසානයෙන් පසු එම බිම් ප්‍රදේශය පාලනය කළේ කවුරුන් ද?

(v) 16 වන සියවසෙන් පසු ශ්‍රී ලංකා ඓතිහාසික අධ්‍යයනය මෑතක් වනතුරු ම පවත්වා ඇත්තේ කුමක් සම්බන්ධයෙන් ද?

05 ඔබ විද්‍යාලයේ වාර්ෂිකව පවත්වනු ලබන ''මාධ්‍ය දිනය'' (Media day) උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. මෙහි දී ඉදිරිපත් කෙරෙන වැඩසටහන් පිළිබඳ න්‍යාය පත්‍රයක් සකස් කළ යුතු වේ. මෙහි සංවිධායක ඔබ යැයි සිතා මෙම උත්සවයේ සෑම අංගයක් ම ඇතුළත් කරමින් කාල කළමනාකරණය කෙරෙහි ද සැලකිලිමත් වෙමින් යෝග්‍ය න්‍යාය පත්‍රයක් පිළියෙල කරන්න.

**නැතහොත්**

පාසල් ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රබල ගැටලුවක් ව පවතී. අයිස් හෙරොයින්, ගංජා ආදී විවිධ නම්වලින් මෙම මත්ද්‍රව්‍ය සමාජයේ දක්නට ලැබේ. ඊට අමතර ව වර්තමානයේ එන්නත් හා පෙති ආදී සූක්ෂම ක්‍රම වලින් ද මත්ද්‍රව්‍ය සමාජගතව ඇත. කායික මෙන් ම මානසික සෞඛ්‍ය පිරිහීම ද පවුල් ආරවුල් ද ආර්ථික ගැටලු හා සමාජ ගැටලු ද මේ නිසා ඉහළ යමින් පවතී. මෙම මත් ද්‍රව්‍ය උවදුරෙන් පාසල් ළමුන් ගලවා ගැනීම සඳහා සමාජය දැනුවත් කිරීමට අත්පත්‍රිකාවක් සකස් කරන්න. (වචන 100 ක් පමණ සෑහේ)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''මම මෙහි පමාවක් නැත්තෙමි තෙපි උකටලී නොවැ නොපමා වැ වසව' යි''

(අ) ඉහත ප්‍රකාශය කර ඇත්තේ කවුරුන් විසින් ද?

(ආ) එම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් හට ද?

(ii) ..............................................

..............................................

වැඳ රද <u>පුදු</u> <u>කමල</u>

දෙසෙක මූසිලයාද උන් කල

(අ) ඉහත පද්‍යයේ හිස්තැනට අදාළ පද ලියා සම්පූර්ණ කරන්න.

(ආ) ඉහත පද්‍යයේ ඉරි ඇඳි පදයේ ඇතුළත් කාව්‍ය අලංකාරය කුමක් ද?

(iii) (අ) සංයුක්ත නිකායට්ඨ කථාව වන පරමත්ථ ජෝතිකාව ලියැවුණු යුගය කුමක් ද?

(ආ) ජනකවි ඉතිහාසයට අනුව ශාන්තිකර්මවල යෙදුණු ජනයා දෙවියන් උදෙසා පැවැත් වූ පුද පූජාවල දී ගායනා කළ කවි වර්ග දෙකක් ලියා දක්වන්න.

(iv) (අ) බැද්දේගම නවකතාවේ මුල් කෘතිය කුමක් ද?

(ආ) මුල් කෘතිය රචනා කළ රචකයා නම් කරන්න.

(v) (අ) එස්. මහින්ද හිමි කවි ලියූ තේමා දෙකක් ලියා දක්වන්න.

(ආ) එස්. මහින්ද හිමියන් රචනා කළ මුල් ම කාව්‍ය සංග්‍රහය කුමක් ද?

(vi) ''රිසි නොවී ද මා පියාට

වාසෙ මාලිගේ

සියුමැලි ඔබ කැටුව ඉන්ට

මේ වනන්තරේ

(අ) ඉහත කොටස ඇතුළත් නිර්මාණය කුමක් ද?

(ආ) එම නිර්මාණකරුවගේ ස්වයංලිඛිත චරිතාපදානය නම් කරන්න.

(vii) (අ) පැරණි ම සිංහල සිවුපද කාව්‍ය ග්‍රන්ථ ලෙස සැලකෙන සන්දේශ කාව්‍ය ග්‍රන්ථ දෙක නම් කරන්න.

(ආ) දැනට හමු වී ඇති පැරණිතම සිංහල කෘතිය ලෙස සැලකෙන කෘතිය කුමක් ද?

(viii) ''කෙකටියා පඳුර සුදු මල් පොකුරු වඩා ගෙන''

(අ) ඉහත පද්‍ය පාඨය ඇතුළත් කාව්‍ය නිර්මාණය කුමක් ද?

(ආ) එම පද්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.

(ix) (අ) සැළලිහිණි සන්දේශය රචනා කිරීමේ අරමුණ කුමක් ද?

(ආ) සැළලිහිණි සන්දේශයේ දූත ආශිර්වාදය ලියැ වී ඇති වෘත්ත කුමක් ද?

(x) පහත සඳහන් රජවරු විසූ යුගය සඳහන් කරන්න.

(අ) සිවුවන සේන රජතුමා

(ආ) දෙවන පරාක්‍රමබාහු රජතුමා (ලකුණු 2 x 10 = 20)

(02) පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ''පුතා මිනිස් දහසක් මැරුව මැනැව. එහේ වන්නා ශිල්පයට උපචාර කළා වේ'යි කීයැ''

(අ) දිසාපාමොක් ඇදුරුතුමාගේ ඉහත ප්‍රකාශයට අහිංසක ශිෂ්‍යයාගෙන් ලැබුණු පිළිතුර කුමක් ද?

(ආ) සමස්ත පාඨයේ අදහස ලිහිල් බසින් ලියන්න.

(ii) පැසෙයි නිබඳ සුවඳල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
<u>දිසෙයි</u> වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි <u>අමා රසමය</u> ඒ පියස දුට

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මෙහි සඳහන් විහාරය කුමක් ද?

(iii)''මහණෙනි ම පුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද?''

(අ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කා විසින් ද ? ම පුතුන් යනුවෙන් නම් කරන්නේ කවුරුන් පිළිබඳව ද?

(ආ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින <u>පිල්බර ගණ</u> ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
<u>සඳැස්</u> සවන් නොකළැයි වූ නොසතුට

(අ) කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(v) නිරිත දිග සුළඟට ඇඹර වී ඇටුවන් බැසී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණි. මුහුණෙත් සිහින් ව ගිය අත් පා වල සම ගසක පොත්තක් මෙන් ගොරහැඩි ව රැලි වැටී ඇටයට ඇලී ගියේ ය.

(අ) ඉහත සඳහන් කොටසින් විස්තර කර ඇත්තේ කුමන අයෙකුගේ ශරීර ස්වභාවය පිළිබඳව ද?

(ආ) ඉහත කොටසේ සඳහන් උපමා දෙකක් ලියා දක්වන්න. (ලකුණු $4 \times 5 = 20$)

(03) (i) හාස්‍යය හා උපහාසය දනවෙන ලෙසිනුත්

(ii) ජීවිතයේ අභියෝග ජයගත් චරිතයක් ලෙසිනුත්, ධර්මසේන හිමියෝ උග්ගසේන සිටු පුත්‍රයාගේ චරිතය නිරූපණය කොට ඇත.

එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

(i) සැප සම්පතින් සපිරුණු ගමක ස්වභාවය ඒ ආකාරයෙන් දක්වීමට ත්,

(ii) ආධ්‍යාත්මික ගුණ වගාවෙන් සපිරුණු ජනතාවක් ගම තුළ ජීවත් වන බව දක්වීමටත්, හංස සන්දේශ කතුවරයා දක්වා ඇති කුසලතාව අගය කළ හැකිය. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

(04) (i) සමස්ත කාන්තා චරිත ස්වභාවය දක්වීමට මැටිල්ඩාගේ චරිතයත්,

(ii) පවුල් සංස්ථාවේ පැවැත්ම සඳහා ඉවසීමෙන් වගකීම් ඉටු කළ යුතු බව දක්වීමට ලොයිසල්ගේ චරිතයත්,

යොදා ගනිමින් සමස්ත සමාජයට මහඟු උපදේශයන් සැපයීමට දියමන්ති මාලය කෙටිකතාකරුවා සමත් වී ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) ජන කවියා පුද්ගල ජීවිත යහපත් ලෙසින් හැඩගැස්වීම සඳහා ලබාදී ඇති උපදෙසුත්

(ii) යොදා ඇති කාව්‍යාලංකාරත්

නිසා උපදෙස් කවි සාර්ථක වී ඇත. එක් කොටසකට නිදසුන් දෙක බැගින් දක්වමින් ''හානා හීය පානා අඬහැරෙන් දූනේ'' යන ජන කවි පෙළ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 15 යි)

(05) දූයේ දරුවන්ගේ සිත් තුළ දේශාභිමානී හැඟීම් ජනිත කරවීමට ඇති සමත්කම ''ජාතික තොටිල්ල පැදිපෙළ තුළින් මනාව ඉස්මතු වේ. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(06) උම්මග්ග ජාතක කතාව තුළ මහෞෂධ පඬිතුමාගේ උපාය කෞශල්‍යය හේතුවෙන් මියුළු නුවර ආරක්‍ෂා වූ ආකාරය දක්වා ඇතත්, එහි දී ජාතක කතා කරුවාගේ වචන හැසිරවීම තුළ සමාජයකට හානි විය හැකිය. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

(07) දැතේ කරගැට පද්‍ය නිර්මාණය තුළින් අතීත ශ්‍රී විභූතිය මනා ලෙස යොදා ගනිමින් ජාතික අභිමානයත්, ශ්‍රමාභිමානයත් ඉස්මතු කර ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 10 යි)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (3) | 21 - (1) | 31 - (3) |
| 2 - (3) | 12 - (4) | 22 - (3) | 32 - (1) |
| 3 - (1) | 13 - (2) | 23 - (3) | 33 - (3) |
| 4 - (4) | 14 - (4) | 24 - (1) | 34 - (4) |
| 5 - (3) | 15 - (2) | 25 - (3) | 35 - (2) |
| 6 - (4) | 16 - (3) | 26 - (4) | 36 - (2) |
| 7 - (1) | 17 - (1) | 27 - (2) | 37 - (4) |
| 8 - (1) | 18 - (2) | 28 - (3) | 38 - (1) |
| 9 - (2) | 19 - (3) | 29 - (3) | 39 - (2) |
| 10 - (1) | 20 - (3) | 30 - (1) | 40 - (4) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

01 (i) (අ) ඖ
(ආ) ක් + ඓ

(ii) (අ) - ප්‍රස්තාව + උචිත
(ආ) - දූර් + අවබෝධය

(iii) ගෘහස්ථ සංක්‍රමණය

(iv) (අ) - කලු -කාන්තිමත්
(ආ) කළු - කළු පැහැය

(v) (අ) කොතෙක් ඉසුරු ලැබුණත් නැණවතා අයෝග්‍ය දේ නොකරයි.
(ආ) අපි සියල්ලෝ ම ශ්‍රී ලංකාවේ වැසියෝ වෙමු.

(vi) (අ) ආශිර්වාද ක්‍රියා / ප්‍රාර්ථනා ක්‍රියා
(ආ) අසම්භාව්‍ය ක්‍රියා / කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(vii) (අ) සොඳුරු දසුන
(ආ) සූර්ය මණ්ඩලය

(viii) (අ) සකසුරුවම
(ආ) චිරස්ථායි

(ix) (අ) කමත
(ආ) හුළං පෙතිය

(x) (අ) වෛද්‍යවරුන් විසින් අසරණ රෝගීහු සුවපත් කෙරෙති / කරනු ලැබෙත් / කරනු ලබත්.
(ආ) ගොවියන් විසින් මේ කන්නයේ සරු අස්වැන්නක් ගනු ලැබේ. / ගනු ලබයි / ගැනෙයි

(02) ලකුණු

* සාරවත් භාවය (මාතෘකාව ඇතුළුව) ලකුණු 08 යි.
* සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12 යි.
* ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදීම ලකුණු 05 යි. මුළු ලකුණු 25 යි.

(03) ප්‍රධාන අදහස්

★ ජීවිතයේ පැවැත්මට වෘක්ෂලතා අවශ්‍යවන බව.
★ වෘක්ෂලතා ආදිය කෙරෙහි සැලකිල්ලක් නොදක්වීමත් ඒවා විනාශ කිරීමත් කාන්තාර ඇති වීමට හේතු වන බව.
★ වෘක්ෂලතාදිය ඇසට ප්‍රියජනක දර්ශනයක් බව.
★ ඒ නිසා වෘක්ෂලතාදිය රැකගත යුතු බව.
★ වෘක්ෂලතාදිය නිසා රටක ඉතිහාසය හැඩ ගැසෙන බව.
★ බොහෝ උගතුන් පෙන්වන පරිදි වන විනාශයේ අයහපත් ප්‍රතිඵල නුදුරේදීම භුක්ති විඳීමට සිදුවන බව.

(04) (i) ★ ලෞකික ඉතිහාසය ලේඛන ගත කිරීමට දියුණු දේශීය සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ නොතිබීම.
★ උඩරට රාජධානියේ ලේඛනාගාරයට අය් කඩදාසි, තල්පත් සුරැකිව නොතිබීම.
★ වැදගත් ලිපි ලේඛන පන්සල් හෝ පුද්ගලයන් සතුව විසිර තිබීම.

(ii) ඔවුන් යටත් විජිත ඉතිහාසය ලියන අතර විදේශීය ආයතන කෙරෙහිද දැඩි උනන්දුවක් දැක්වීම නිසා වන ප්‍රවණතාවක් ඇති වීම.

(iii) උඩරට රාජධානිය

(iv) පෘතුගීසි හා ලන්දේසි

(v) දිවයිනෙහි බටහිර මුහුදු තීරයෙහි පාලන බලය දරුවන් මුහුණු පෑ ගැටලු පිළිබඳව ය.

(05)

| න්‍යාය පත්‍රය | | අත් පත්‍රිකාව | |
|---|---|---|---|
| ආකෘතිය | - ලකුණු 04 | ආකෘතිය | - ලකුණු 04 |
| අන්තර්ගතය | - ලකුණු 08 | අන්තර්ගතය | - ලකුණු 08 |
| ශිල්පීය දක්ෂතා | - ලකුණු 03 | ශිල්පීය දක්ෂතා | - ලකුණු 03 |

## III කොටස

01 (i) (අ) බෝධිසත්වයන් වහන්සේ / මහෞෂධ පඬිතුමා
(ආ) මහෞෂධ පඬිතුමාගේ චරපුරුෂයන් හට

(ii) (අ) නොදැන ම තමා බල
සබයට අවුත් නො පැකිළ
(ආ) රූපක

(iii) (අ) අනුරාධපුර යුගය
(ආ) දෙවොල්මඩු, ගම්මඩු, කෝල්මුර

(iv) (අ) Village in the Jungle / විලේජ් ඉන් ද ජංගල්
(ආ) ලෙනාඩ් වුල්ෆ්

(v) (අ) ළමයින් උදෙසා / දේශානුරාගය හා දේශාභිමානය බුද්ධාභිවන්දනා
(ආ) ඔවාමුතු

(vi) (අ) සිංහබාහු නාට්‍යය
(ආ) පිං ඇති සරසවිවරමක් දෙන්නේ

(vii) (අ) තිසර හා මයූර සංදේශය
(ආ) දම්පියා අටුවා ගැටපදය

(viii) (අ) වස්සානය
(ආ) රත්න ශ්‍රී විජේසිංහ මහතා

(ix) (අ) සවන පරාක්‍රමබාහු රජුගේ කනිටු දියණියන් වන ලෝකනාථා දේවියට / උලකුඩය දේවියට පුත් කුමරකු ලබා දෙන ලෙස ඉල්ලමින් කැලණියේ විභීෂණ දෙවියන්ට ආයාචනා කිරීම.
(ආ) යහගී විරිත

(x) (අ) අනුරාධපුර යුගය
(ආ) දඹදෙණි යුගය

(02) (i) (අ) ''ඇපි අන්නට හිංසා නොකරන කුලයෙහි උපන්නම්හ. එසේ නොකට හැක්කැ ය කී යැ'' (සරල බසින් ලියා ඇතත් ලකුණු පිරිනමන්න.)
(ආ) පුතේ, මිනිසුන් දහසක් මැරිය යුතුය. එසේ කළොත් ඉගෙනගත් ශිල්පයට ගෞරව, සත්කාර වනුවෙ වේ.

(ii) (අ) දිසෙයි - දෘශ්‍යමාන වෙයි / පෙනෙයි
අමාරසමය - අමෘත රසය
(ආ) කැරගල පද්මාවතී පිරිවෙන් විහාරය

(iii) (අ) බුදුරජාණන් වහන්සේ විසින්
උග්ගසේන තෙරුන් පිළිබඳව
(ආ) ධම් සභාවේ සිටි තෙරුන් වහන්සේ නමක් උග්ගසේන තෙරුන් වහන්සේ හුණදණ්ඩෙන් බස්නා විට භයෙක් නැතැයි කියූ බව බුදුරජාණන් වහන්සේට දැන් වූ පසු බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු දුන්

(iv) (අ) පිල්බර ගණ - මොනර සමූහයා
සඳැස් - පිල් අග ඇති ඇස් ආකාර සලකුණු

(ආ) සතුට ඇති කරන වීණා නාදය ඇසීමට ගොදුරු සොයා නොගොස් සිටින මොනර සමූහයා විශේෂ ස්වරූපයකින් තමන් මැවුවත් පිල් අග ඇති ඇස් ආකාර සලකුණු කන් නොකළේ යයි මහා බ්‍රහ්මයාට අසතුට පළ කළහ.

(v) (අ) කර්ලිනාහාමිගෙ

(ආ) ඇටුවන් බැහීගිය ගහක් මෙන්
ගසක පොත්තක් මෙන් (ලකුණු 4 x 5 = 20 යි)

(03) (i) <u>හාස්‍ය හා උපහාසය</u>

- ★ උග්ගසේන එක් දවසක් කඹයේ නටන එකකුගේ දුවක් දැක ඇය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටින ආකාරය.

''ඇ කෙරෙහි බලවත් ප්‍රේම ඇතිව ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි සිතාගෙන නොකා නොබී හැඳට නැගිලා වැඳ හොත්තා හ.''

- ★ උග්ගසේනට දාව ඉපදුණු දරුවා ඔහුගේ බිරිඳ විසින් නළවන අවස්ථාව.
- ★ ගැල් රකිනවුගේ පුත ''බර උසුලන්වුන්ගේ පුත'' ''කුමක් නොදන්නවුන්ගේ පුතැ''යි කිය කියා දරුවා නළවයි.

(ii) <u>ජීවිතයේ අභියෝග ජයගත් චරිතයක්</u>

''මේ හැම මා අරභයා කියවූ දැයි විචාළෝ ය.''

''මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තැන් ඇති හෙයින් සම්පතක් නිසාත් නොවෙයි. තමා ජාති සම්පන්න නොවන හෙයින් ජාතියක් නිසාත් නොවෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය.'' යන සිතුවිල්ල ඇතිව ''ඇගේ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි. මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන ගෙන.......''

''මෙතෙනට සත්වන දවස් මම ශිල්ප දක්වමි.''

''සත්වන දවස් බොහෝ දෙනෙක් රැස්ව මැසි මත්තේ මැසිලා ගත්හ. උග්ගසේන සිටු පුතුන් ද සැට රියන් හුණ දණ්ඩක් බිම හිඳුවාලා හුණ දඬු අගට නැංගෝය.''

''බුදුහුත් දකුණත දික් කොට ලා මහණ මෙසේ එව''යි වදාළ සේක. ඒ වේලෙහි තුන් සිවුරු ආදී වූ අටපිරිකර ධාරා සැටවස් ගිය මහ හෙර කෙනෙකුන් වහන්සේ මෙන් ආකල්ප සම්පන්න වූ සේක''

නැතහොත්,

(i) <u>සැප සම්පතින් ආඪ්‍ය ගමක ස්වභාවය සඳහා නිදසුන්</u>

- ★ සාර පලය අඹ දඹ රඹ ද වල්පිට .... යන කවිය
- ★ කුළින් කුළම සිහල' ඔ වැහෙන කඳුරැය.... යන කවිය
- ★ පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට..... යන කවිය

(ii) <u>අධ්‍යාත්ම ගුණවගාවෙන් සපිරුණු බවට නිදසුන්</u>

- ★ ''නොයෙක් තැනම පිපිමල් පිරුණු පොකුණු ය''..... යන කවිය
- ★ ''දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය'' ...... යන කවිය
- ★ ''නිබඳ පැසී පල ලඹ දෙන මිහිරඹය'' ..... යන කවිය

(ලකුණු නිදසුන් සඳහා 4 පැහැදිලි කිරීමට11)

(04) (i) <u>සමස්ත කාන්තා චරිත ස්වභාවය මැටිල්ඩාගේ චරිතයෙන් දැක්වීම.</u>

- ★ ඕනෑම කාන්තාවක් හැඩට ඇඳීමට, පැලඳීමට, සතුටින් සිටීමට කැමතිය. ඒ බව මැටිල්ඩාගේ සිහින ලෝකයෙන් මනාව නිරූපණය වේ.

'' බිත්තිවල එල්ලන ලද පෞරාණික මනුෂ්‍ය වර්ගයන්ගෙන් හා දෙව්ලියන්ගෙන් සැදුණු වන රොදක පියාඹන අද්භූත පක්ෂීන්ගේ රූපසටහන්වලින් පිරුණු වර්ණවත් තිර රෙදි ගැනය. කාන්තියෙන් කැලුම් විහිදූ රිදී මුවා බඳුන් ගැනය. ප්‍රණීත ආහාරපාන ගැනය.''

- ★ එසේම ඕනෑම කාන්තාවක් ජීවිතයට පැමිණෙන දුක් කරදර විඳ දරා ගනිමින් අභියෝග ජය ගැනීමට සමත් ය. ඒ බව මැටිල්ඩාගේ චරිතයෙන් නිරූපණය වේ.
- ★ දියමන්ති මාලය නැති වීමෙන් පසු නියම කාන්තාවක් ආකාරයෙන් ජීවිතයේ ප්‍රශ්නවලට මුහුණ දුනි.

''ඇ තෙල් සහිත හැළි වළන් ද වෙනත් මැටි බඳුන් ද පිඟන් කෝප්ප හා දීසි පීරිසි ද තම රෝස පැහැති නිය ගෙවීයන තුරු සේදුවාය.''

''දිළිඳු ගැහැනියක මෙන් ඇඳුම් පැලඳුම් කළ ඇ අතේ එල්ලාගත් මල්ලක් ඇතිව පලතුරු කුළු බඩු මස් ආදිය විකුණන වෙළෙන්දන් වෙත ගොස් සෑම තඹයක්ම ඉතිරි කර ගැනීමේ බලාපොරොත්තුවෙන් ඔවුන් සමග කේවල් කරමින් සණ්ඩු දබර කරමින් නින්දා අපහස වින්දා ය.

(ii) <u>ලොයිසල්ගේ චරිතය</u>

- ★ පවුල් සංස්ථාවක යහපත් පැවැත්මක් සඳහා ස්වාමියෙකු තම බිරිඳ මනා සේ අවබෝධයෙන් තේරුම්ගත යුතු වේ.
- ★ මැටිල්ඩා ලස්සනට ඇඳීමට, පැලඳීමට හා සෑම විටම සතුටින් සිටීමට කැමති බිරිඳක් බව තේරුම්ගෙන ලොයිසල් කටයුතු කළේ ය.

  ''එක්තරා සන්ධ්‍යාවක දී ලොකු ලියුම් කවරයක් අතින් ගත් ඇගේ සැමියා මහත් සන්තෝෂයකින් නිවසට පැමිණියේ ය.

  ''ඔන්න ඔයාට බඩුවක් තියනවා'යි ඔහු කීය.''
- ★ මේ අවස්ථාවේ පටන් ලොයිසල් තම බිරිඳව සාදයට සහභාගි කරවීමට ඔහු ඉවසීමෙන් කටයුතු කළ ආකාරය ලිවිය යුතු ය.
- ★ දියමන්ති මාලය නැති වූ පසු ද ලොයිසල් ඉවසීමෙන් දුරදිග බලා කටයුතු කළ ආකාරය ලිවිය යුතුය.

  ''ප්‍රොමසරි නෝට්ටුවලට අත්සන් තැබූ ඔහු විනාශකාරී ගිවිසුම්වලට මැදිහත් විය. අධික ලෙස පොළී අය කරන්නන් හා මුදල් ණයට දෙන්නන් සමග බැඳුම්වලට එළඹුණෝ ය.''

  ''අවුරුදු දහය අවසානයේ ණය තුරුස් සියල්ලම අධික පොළී ගන්නන්ගේ මුදල් ද වැල් පොලියෙන් එකපිට එකතු වූ මුදල් ද ආදී වශයෙන් ණය තුරුස් සියල්ල ම ඔවුහු ගෙවා නිදහස් කර දැමූ හ.''

(ලකුණු 15 යි)

- ★ මෙම නිදසුන්වලට අමතරව ගැළපෙන නිදසුන් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

  නැතහොත්

ගැළපෙන නිදසුන් සහිතව පිළිතුර පැහැදිලි කර ඇත්නම් ලකුණු පිරිනමන්න.

5, 6, 7 ප්‍රශ්න සඳහා ද ගැළපෙන නිදසුන් සහිතව පිළිතුර පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු නිදසුන් තුනට 03 යි. පැහැදිලි කිරීමට 07 යි. මුළු ලකුණු 10 යි.)